***ලංකා තේ ඇතුළු අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන ආනයනය සම්බන්ධයෙන් පැනවූ තාවකාලික තහනම ඉවත් කිරීම***

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපතිවරයා සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු නව දෙනෙකුගෙන් සමන්විත තාක්ෂණික කමිටුවක් රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපතිවරයා සමඟ එක්ව, රුසියානු පශු සම්පත් සහ ශාක සෞඛ්‍යාරක්ෂිත ප්‍රමිතීන් ප්‍රවීක්ෂණය කිරීමේ සේවාවේ ප්‍රධානියා, එම සේවාවේ උප ප්‍රධානියා සහ අනෙකුත් නිලධාරීන් සමඟ 2017 දෙසැම්බර් මස 25 වැනි දින ඵලදායී සාකච්ඡාවක් පැවැත්වීය.

රුසියානු කෘෂිකර්ම, විදේශ කටයුතු සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ නියෝජිතයෝද, රුසියානු තේ හා කෝපි සංගමයේ නියෝජිතයෝද මෙම රැස්වීමට සහභාගී වූහ.

පළිබෝධවලින් තොර ශාක නිෂ්පාදන රුසියාවට අපනයනය කිරීම සහතික වීම සඳහා ශ්‍රී ලංකාව විසින් යෝජනා කරනු ලැබූ පියවර සම්බන්ධයෙන් තමන් සෑහීමට පත්වන බව සාකච්ඡාව අතරතුරදී රුසියානු නියෝජිතයෝ ප්‍රකාශ කළහ.

ශ්‍රී ලංකාවේ වත්මන් ශාක නිරෝධායන ක්‍රියාපරිපාටිය පිළිබඳව අවබෝධයක් ලබාගැනීම සඳහා 2018 වසරේ ජනවාරි මස අග හෝ පෙබරවාරි මස මුල රුසියානු තාක්ෂණ විශේෂඥයන්ගෙන් සමන්විත කණ්ඩායමක් මෙරට සංචාරයක නිරතවීමට මෙහිදී එකඟතාවක් ඇති කරගන්නා ලදී.

තේවල සිටි බවට හඳුනාගත් කෘමියා පිළිබඳව 1978 සිට මේ දක්වා කිසිදු වාර්තාවක් හමුවී නොමැති බවත්, මෙය අදාළ තේ තොගය අඩංගු බහාලුමෙහි විෂබීජ නැසීම නිසි පරිදි සිදු නොවීමේ ප්‍රතිඵලයක් වන්නට ඇති බවත් ශ්‍රී ලංකා නියෝජිත පිරිස ප්‍රකාශ කළේය. කෙසේවුවද, මෙවැනි ක්‍රියාවක් යළි සිදු නොවීමට වග බලා ගනිමින් ශාක නිෂ්පාදන අපනයනයේදී දැනට පවතින සෞඛ්‍යාරක්ෂිත ප්‍රමිතීන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා දැඩි පියවර ගන්නා බවට ශ්‍රී ලංකාව මෙහිදී සහතික විය.

ශ්‍රී ලංකාව මුහුණ පා ඇති ගැටලුව සහ ඒ සම්බන්ධ ඉදිරි පියවර අවබෝධ කරගනිමින් ශාක නිෂ්පාදන ආනයන සම්බන්ධයෙන් කලින් පනවා තිබූ තාවකාලික තහනම 2017 දෙසැම්බර් 30 වැනිදාට පෙර ඉවත් කිරීමට තීරණය කළ බව රුසියාව මෙහිදී ප්‍රකාශ කර සිටියේය. ශ්‍රී ලංකා ජනාධිපතිවරයා විසින් රුසියානු සමූහාණ්ඩුවේ ජනාධිපතිවරයා වෙත මේ සම්බන්ධයෙන් යවන ලද ලිපිය මෙම ගැටලුවට ධනාත්මක ආකාරයෙන් විසැඳුමක් ලැබීමට මහෝපකාරී විය.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය සහ ජාතික ශාක නිරෝධායන සේවය ගත් කාලෝචිත පියවර මෙම තාවකාලික තහනම ඉතා ඉක්මනින් ඉවත් කරගැනීමට ඉවහල් විය.

සාමාන්‍යයෙන් රුසියානු පශු සම්පත් සහ ශාක සෞඛ්‍යාරක්ෂිත ප්‍රමිතීන් ප්‍රවීක්ෂණය කිරීමේ සේවාව විසින් පනවනු ලබන මෙවැනි ආනයන තහනමක් යළි සලකාබැලීමට මාස 3-4 ක් හෝ ඊට වඩා වැඩි කාලයක් ගත වේ. කෙසේවුවද, අදාල සියලු පාර්ශ්වවල ඉක්මන් සහ ඵලදායී ක්‍රියාකාරීත්වය හා සම්බන්ධීකරණය හේතුවෙන් මෙම තහනම රුසියාව විසින් සතියක් ඇතුළතදී ඉවත් කරනු ලැබිණි.

ඉතාමත් කෙටි කාලයක් ඇතුළත මෙම ගැටලුවට ධනාත්මක විසැඳුමක් ලැබීම පිළිබඳව රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපතිවරයා සහ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සිය සතුට පළ කරයි.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
මොස්කව්
2017 දෙසැම්බර් 25 වැනිදා